# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2444/26 - 2025 ජූලි මස 09 වැනි බදාදා - 2025.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශ ගොනු අංකය*: 4-3/7/2020/hw/205.
*මගේ අංකය*: DIVPG/LND/LA/AQURE/6/13.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 881 අහුගොඩ බටහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන සකස් කරන ලද කැඩැස්තර සිතියම් අංක 421705 හි කලාප අංක 01, පත්‍ර අංක 01 හා 2025.06.09 දිනැති සිතියමේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබලි.

**01.** කැබලි අංක 1 -

ඉඩමේ නම: -; හිමිකම් කියන්නා: එල්. එච්. එම්. චමින්ද බණ්ඩාර සහ තවත් අය, උඩවත්ත, අහුගොඩ, පොතුහැර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0228.

**02.** කැබලි අංක 2 -

ඉඩමේ නම: උඩවත්තේහේන; හිමිකම් කියන්නා: ඒ. එම්. ඥානවති, අහුගොඩ, පොතුහැර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0073.

**03.** කැබලි අංක 3 -

ඉඩමේ නම: උඩවත්තේහේන; හිමිකම් කියන්නා: ඒ. එම්. තිලකරත්න බණ්ඩා, අහුගොඩ, පොතුහැර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0065.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ජූලි මස 31 දින පෙ.ව.10.00 ට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 ජූලි මස 17 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ආර්. එම්. එස්. එන්. රාජපක්ෂ,**
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2025 ජූලි මස 07 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0091


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*